# විශේෂාංගය




## " අපේම රටේ නිපදවූ අපේම මෝටර් රියක්..."

මයික්‍රෝ කියන නම ඇසුන පමණින්ම අපට සිහි වනනේ අපේ අත ඇති මුදලට ලබා ගත හැකි අපේ රටේම එකළස් කරන මෝටර් රථයකි. මීට දශකයකට පමණ පෙර අපේ රටේ මහ තොට දී අහම්බෙන් දක්නට ලැබුණු මයික්‍රෝ කාරය මේ වන විට ඉතා ජනප්‍රිය මෝටර් රථයක් බවට පත්වී ඇත්තේ එක් වාහන මාදිලියකින් නොනැවති මෝටර් රථ රැසක්ම නිපදවීම නිසා බැවිනි. මයික්‍රෝ සමාගම සතුව පවතින මෝටර් රථ අද ලෝකයේ භාවිතා කරන ඉහළම තාක්ෂණයෙන් යුතු ඒවාද වීම එයට හේතුවයි.

REXTON, KYRON, ACTYON යන නම් වලින් හදුන්වන මෝටර් රථ ලොව වෙනත් මෝටර් රථ වලටද නොදෙවෙනි ගමනක යෙදෙයි. මේ අතරින් REXTON නම් වු මෝටර් රථය SPORT UTILITY VEHICAL ගණයට අයත් වෙයි. මෙම වාහනයේ එන්ජින් ධාරිතාවය 2700 CC වන අතර ඩීසල් භාවිතා කරන ඉන්ටර්කුල් ටර්බෝ එන්ජිම කොරියාවෙන් ආනයනය කර අපේ රටේ පොල්ගහවෙල හා සීදුවේ එකලස් කිරීමේ කර්මාන්ත තුල එකලස් වීම සිදු කෙරේ. තවද REXTON මෝටර් රථයේ විශේෂත්වය පිරික්සුව හොත් රෝද 04 ටම ජවය ලැබෙන AWD සහ අවශ්‍ය විටෙක රෝද 04 ටම ජවය ලැබෙන 4WD රථ මාදිලි දෙකක් නිපදවීම සිදුවේ. ආසන 05 කින් හෝ 07 කින් නිපදවෙන REXTON හි ස්වයංකීය ට්‍රිප් සොනික් ගියර් පද්ධතියකින් සමන්විත නිසා වේගය පාලනය කිරිම සුක්කානම මත ඇති බොත්තම් මගින් කල හැකිය. රථයේ සුක්කානම මත ඇති තවත් බොත්තම් මගින් එහි ඇති CD, DVD, MP3 ප්ලේයර් වල සහ ගුවන් විදුලි යන්ත්‍ර වල හඩ පාලනය සහ ගුවන් විදුලි සේවා සංඛ්‍යාත මාරු කිරිමත් කල හැකිය අවශ්‍ය වන විටෙක පසුපස ආසන හකුලවා ගන්නට හැකි අතර ද්විත්ව වායු සමීකරණ පද්ධතියකින් යුතු මෙම රථයේ සවි කර ඇති උපාංග මගින් වාහනය තුළ අවශ්‍ය පරිදි උෂ්ණත්වය පාලනය කර ගත හැකිය.

එපණකින්ද නොනවතින MICRO හි REXTON රථයේ හදිසි අවශ්‍යතාවක දි අවශ්‍ය වුවහොත් එයාර් බෑග් ආරක්ෂක පද්ධතියක් ද සවිකර ඇත. වර්ණ 06 කින් ඔබ වෙතට එන REXTON මෝටර් රථයේ නවීන තාක්ෂණයෙන් නිපදවා ඇති EBD (Electronic Brake Distributor ) සහ ESP ( Electronic Stability Programme ) තිරිංග පද්ධති සවිකර ඇත. පැයට 220 Km උපරිම වේගයක් ලබා ගත හැකි වන මෙවැනි සුඛෝපබෝගි රථයක් ලංකාවේ නිපදවූ ප්‍රථම අවස්ථාව මෙයවේ. ප්‍රධානම වශයෙන් 2000 cc එන්ජින් වර්ගයෙන් හා හැඩයෙන් පමණක් වෙනස් වී ඇති KYRON ද MICRO සමාගමේ වැයමක ප්‍රථිපලයක් වී තිබේ. තවද තෙවැන්න වන්නේ 2000 CC එන්ජිමකින් සමන්විත වන ACTYON SUV රථයයි. ඉහළින් සදහන් කරන ලද පහසුකම් වලින් සමන්විත වී පරිපුර්ණ වු මෙම රථයේ හැඩය ඩබල් කැබ් රථයක් විම නිසා ACTYON ලෙස නම් දරා ඇත.

මසකට මාදිලි 04 කින් රථ 300 ක් පමණ එකළස් කිරිමට ප්‍රධාන වි ඇත්තේ ශ්‍රී ලාංකිය දේශියත්වයට ගරු කරමින් MICRO සමාගමෙන් රථ වාහන මිලදි ගැනිමට අපේ පිරිස් පෙලඹී තිබීමත් මෙවන් සුඛෝපබෝගි වාහනයක් වෙනත් සමාගම් වල මිල හා සසදන විට ලක්ෂ 54 සහ 85 අතර පමණ ප්‍රමාණයකට මිලදි ගැනිමට හැකියාවක් ලැබීමත් ය. ඒ වාගේම වාහන කොටස් ද හිගයක් නොවන බවට පවතින විශ්වාසය ද බලපා තිබේ.

Compiled by Nayomei Wijayasooriya.
29/02/2008.